# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1968/11 - 2016 මැයි මස 25 වැනි බදාදා - 2016.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනය

රේගු ආඥාපනත (235 වන අධිකාරය)

**101 වැනි වගන්තිය යටතේ වන නියෝගය**

***මෝටර් වාහන සඳහා රේගු වටිනාකම (මිළ) නියම කිරීම***

රේගු ආඥාපනතේ (235 වන අධිකාරය) 101 (1) (එච්) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 87.02, 87.03, 87.04, 87.05 සහ 87.11 යටතේ වර්ගීකරණය වන ආනයනය කරනු ලබන මෝටර් වාහන සඳහා තීරු බදු සහ අනෙකුත් සියලු බදු හා ගාස්තු අයකිරීම සඳහා වටිනාකම ගණනය කිරීමේ පදනම මෙයින් නියම කරනු ලැබේ. මෙම නියෝගය 2016 මැයි මස 26 වැනි දින සිට නැවත දන්වන තෙක් බලපැවැත්වේ.

සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 87.02, 87.03, 87.04, 87.05 සහ 87.11 යටතේ වර්ගීකරණය වන මෝටර් වාහන සඳහා රේගු වටිනාකම පහත සඳහන් අයිතමයන් (1) අ හෝ (1) ආ සහ (2), (3), (4) හා (5) හි එකතුව වන පරිදි ගණනය කළ යුතු ය.

(1) (අ) **අළුත්ම වාහනයක් සඳහා ගණුදෙනු වටිනාකම**
අළුත්ම වාහනයක් සඳහා ගණුදෙනු වටිනාකම එකී වාහනයේ නිෂ්පාදකයා විසින් නිකුත් කරන ලද හෝ නිෂ්පාදකයා විසින් සහතික කරන ලද ඉන්වොයිසියක් මගින් තහවුරු කළ යුතු ය.

(ආ) **ඉහත (අ) කාණ්ඩය යටතට නොගැනෙන මෝටර් රථ සඳහා ගණුදෙනු වටිනාකම**
ඉහත (අ) කාණ්ඩය යටතට නොගැනෙන මෝටර් රථ සඳහා ගණුදෙනු වටිනාකම එම වර්ගයේ හෝ ඊට හැම අතින්ම සමාන අළුත්ම වාහනයක වටිනාකමින් (දේශීය වශයෙන් අදාළ වන බදු ඇතුළත් නොවේ) 82.5% කට වඩා අඩු නොවිය යුතුය. ගණුදෙනු වටිනාකම එකී වාහනය අපනයනය කරන රටේ වෙන්දේසි සහතිකය හෝ දේශීය බදු ආපසු ගෙවීමේ සහතිකය හෝ රේගු ආනයන සටහන්කරයක් මගින් තහවුරු කළ යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ වරාය දක්වා ප්‍රවාහන ගාස්තු

(3) ශ්‍රී ලංකාවේ වරාය දක්වා රක්ෂණ ගාස්තු

(4) ශ්‍රී ලංකාවේ වරාය දක්වා ප්‍රවාහනය කිරීමට අදාළ පැටවීම, බෑම සහ අදාළ මෙහෙයුම් ගාස්තු සහ

(5) ගැනුම්කරු විසින් වියදම් දරනු ලැබූ තැරව් ගාස්තු සහ විකුණුම් කොමිස්

2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ ඉ උපලේඛනයේ 10 වැනි වගන්තිය යටතේ වර්ෂ 2016 මාර්තු මස 01 දින පළ කරන ලද අංක 1956/17 දරන ගැසට් නිවේදනය 2016, මැයි මස 25 දින සිට මෙයින් අවලංගු කරමි. කෙසේ වුවද, 2015 ඔක්තෝබර් මස 18 වැනි දින හෝ ඊට පෙර ප්‍රතිෂ්ඨාපනය කරන ලද සහ පසුව සංශෝධනය නොකරන ලද ණයවර ලිපිය (ලිපි) පදනම් කරගෙන ආනයනය කරන ලද මෝටර් වාහන වල රේගු වටිනාකම තීරණය කිරීම සඳහා අංක 1901/3 දරන 2015 පෙබරවාරි මස 10 වැනි දිනැති ගැසට් නිවේදනය අවලංගු සේ නොසලකා කටයුතු කළ යුතු වේ.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 මැයි මස 25 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

06 - 569